දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය -2020 (පුනර් 2016) - 2022 පෙබරවාරි / මාර්තු
First Examination in Arts (External) - 2020 (Repeat 2016) – February / March 2022

# සිංප්‍ර 1.1 - සිංහල භාෂා ප්‍රවේශය
# SL 1.1 – Approach to the Sinhala Language

කාලය පැය (03) තුන යි.

නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකි ය. ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01.
(i) උච්චාරණ ස්ථාන සහ උච්චාරණ කරණ ආශ්‍රය කොටගෙන ව්‍යංජන ශබ්ද අනුවර්ගවලට බෙදෙන ආකාරය සැකෙවින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) පහත දැක්වෙන වචන අකාරාදී අනුපිළිවෙළට අනුව සකසන්න.
- (අ) සඳුන්, සඳ, හඬ, හොඬවැල
- (ආ) ජීවිතාශාව, ජෛන, ජෛව, ජුගුප්සාව
- (ඇ) දිව්‍යාක්ෂර, දුෂ්ටකෘත, දිව්‍යෞෂධ, දිෂ්ටිය
- (ඉ) දුස්සාධ්‍ය, දුස්සීල, දුෂ්ටාංග, ඓක්‍යය
- (ඊ) මෘත්‍යු, ප්‍රතිමාංසරය, මෞනව්‍රතය, මෘත

(ලකුණු 10)

02.
(i) පහත දැක්වෙන සන්ධි පද විසන්ධි කර දක්වමින් සන්ධි විධිය ද නම් කරන්න.
- (අ) අම්මල්
- (ආ) දුග්ගන්නා
- (ඇ) මහෙසි
- (ඉ) එදිනෙදා
- (ඊ) සුස්මෙන්

(ලකුණු 2x5 = 10)

(ii) පහත වැකිවල තද කළු අකුරින් දැක්වෙන පද අයත්වන ක්‍රියා වර්ගය නම් කර එය සැකෙවින් පහදන්න.
- (අ) වෛද්‍යවරයා හෙදිය ලවා රෝගියා ***අවදිකරවයි.***
- (ආ) බැළලිය පැටවා ***සොයමින්*** කෑගසයි.
- (ඇ) මල්ලී පුස්තකාලයට ***ගොස්*** අලුත් පොත් කියෙව්වේ ය.
- (ඉ) ඔබට යහපතක්ම ***වේවා!***
- (ඊ) වැසි ***වසිද්දී*** අපි ක්‍රීඩා කළෙමු.

(ලකුණු 2x5 = 10)

03. සමාස පිළිබඳ සිදත් සඟරාකරුගේ අදහස පහදමින් අන්‍යාර්ථ සමාසයෙහි ප්‍රභේද සනිදර්ශන ව විමසන්න.

(ලකුණු 20)

04. නිපාත පද, භාෂා ව්‍යවහාරයේ දී විවිධාර්ථයේ යෙදෙමින් අර්ථ නිෂ්පත්තියෙහි ලා සිදු කරනු ලබන දායකත්වය උදාහරණ ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

05. සිංහල භාෂාවෙහි යෙදෙන තද්ධිත ප්‍රත්‍යය සසාධක ව විමසන්න.

(ලකුණු 20)

06. පහත මාතෘකාවලට කෙටි සටහන් සම්පාදනය කරන්න.

(අ) උපසර්ග පද

(ආ) කරණ විභක්තිය සහ අවධි විභක්තිය

(ඇ) විශේෂණ සමාසය

(ඉ) ස්ත්‍රී ලිංග පද සාධනය

(එක් කොටසකට ලකුණු 05 බැගින් (05x4) ලකුණු 20 කි)

07. පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවන්න.

01. අපරාධකරුවෝ රටෙහි නීති උල්ලංඝනය කරති.
02. විදෙස් ශිෂ්‍යයෝ ශ්‍රී ලාංකේය ඉතිහාසය අධ්‍යයනය කළහ.
03. ආයතන අධ්‍යක්ෂකවරු හදිසියේම සේවකයන් කැඳවූහ.
04. දඩයක්කාරයෝ උගුළ අටවති.
05. විද්‍යා චක්‍රවර්තීහු බුත්සරණ ලියූහ.
06. කිවිඳාණෝ දුහුනන් ඇමතූහ.
07. වීදියෙහි ගමන් කරමින් සිටි මඟීහු යාචකයන්ට ආහාර බෙදූහ.
08. බිසෝවරු රාජකීය උත්සවය සූදානම් කරති.
09. අක්කා මල්ලී නැළවූවා ය.
10. දේවිය සේවිකාවන් ලවා දරුවන් බලවයි.

(ලකුණු 2x10 = 10)

08. උක්තාඛ්‍යාත රීතිවලට අනුකූල ව පහත වාක්‍ය නිදොස් කොට ලියා දක්වන්න.

01 සේනකයා ගොයෙක් මෙන් බඩ ගා යන්නට සැරසුණේ ය.
02. කුඩා දරුවා රකුසෙක් දැක බියට පත් වූවේ ය.
03. ආයතනයෙහි සිටි ඇතමෙකු යෝජනාවට විපක්ෂ විය.
04. බුද්ධිමත් නායකයා නිරතුරුව ම දක්ෂ කථිකයෙකු ද වෙති.
05. මල්ලී ද නංගී ද මම ද ගෙදර ගියේ ය.
06. දේශපාලකයා නොහොත් අතවැසියෝ අර්බුද ඇති කළේ ය.
07. බිසෝ තොමෝ දිය කෙළියට පැමිණියහ.
08. දේශනය ලබන සිකුරාදා පවත්වයි.
09. තරු කැල රාත්‍රී අහසේ බබලති.
10. රජතුමනි, රාජපුරුෂයන් කොහිදැයි' බිසව ඇසුවා ය.

(ලකුණු 20 (2x10))

(සෑම පිළිතුරකටම ලකුණු 20 බැගිනි)

*******************